## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව,කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය 2010 දෙසැම්බර 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම වාර්තා පවත්වා ඇති බවත්,මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

--------------------------------------------

1.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ප්‍රකාරව රජයේ ප්‍රදාන ඒවායින් හිලව් කිරීමට බලාපොරොත්තු වන සම්බන්ධිත පිරිවැයන් සමඟ ගැලපීමට අවශ්‍ය වන කාලපරිච්ඡේදයන් තුල ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස හඳුනාගත යුතුය. කෙසේ වුවද, 2010 දෙසැම්බර් 31 දිනට ලැබී ඇති රු.110,672,184 ක වූ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන සෘජුවම කොටස්කරුවන්ගේ අයිතියට ගෙන තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී ස්ථාවර වත්කම් මත ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය සංශෝධනය කර තිබුනද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 ප්‍රකාරව 2010 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් පිළිබඳ නව ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුව පෙර වර්ෂයට අදාළ ගැලපීම් කර නොතිබුණි.

(ඇ) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 සහ 42 ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම සුදුසුකම් ලත් ආයු ගණකාධිකයකු හෝ පාර්තෝෂික සූත්‍රයක් අනුගමනය කරමින් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද පාර්තෝෂික බැරකම එම අවශ්‍යතාවයට අනුකූලව ගණනය කර නොතිබුණි.

1:2:2 **ගණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂය තුළදී බඩ ඉරිඟු රක්ෂණ 15 ක් සඳහා වන්දි ගෙවීම් කිරීමේදී රු.58,440 ක වැඩිපුර ගෙවීම් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි විය.

| පදේශය | ගෙවීම් සංඛ්‍යාව | ගෙවියයුතු මුදල | ගෙවූ මුදල | වැඩිපුර ගෙවීම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| කහටගස් දිගිලිය | 02 | 16,800 | 28,500 | 11,700 |
| මිහින්තලේ | 01 | 4,500 | 8,000 | 3,500 |
| ගලෙන් බිඳුනුවැව | 01 | 11,700 | 20,250 | 8,550 |
| නොච්චියාගම | 03 | 17,350 | 33,600 | 16,250 |
| හොරොව්පතාන | 08 | 36,760 | 55,200 | 18,440 |
| එකතුව | 15 | 87,110 | 145,550 | 58,440 |

1:2:3 **පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රගති වාර්තා අනුව රක්ෂණ වාරික වලින් ලද ආදායම රු.මිලියන 105.484 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන වලට අනුව එය රු. මිලියන105.063 ක් වූයෙන් රු. මිලියන0.421 ක වෙනසක් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලට අනුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවානියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් ලෙස ආදායම් ප්‍රකාශයට ගෙන තිබුණේ පිළිවෙලින් රු.3,885,009 ක් හා රු.906,278 කි. එම සංඛ්‍යා වලට එළඹී ඇත්තේ සේවක අර්ථ සාධක අරමුදල් සඳහා වැටුප් පමාණය රු.32,375,079 ක් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා වැටුප් පමාණය රු.30,209,271 ක් වශයෙන් සැලකීමෙනි. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් ගණනය කිරීම සඳහා වෙනස් වැටුප් පමාණයන් සැලකීමට ගැනමට හේතුන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1:2:4 **ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති සේවක ණය සහ අත්තිකාරම් ශේෂ වලින් එකතුව රු.1,315,578 ක් දීර්ඝ කාලයක සිට ගිණුම්වල අයනොවී පැවතුණි. විස්තර පහත දැක්වේ.

රු.

| | |
|---|---|
| ආපදා ණය | 919,095 |
| උත්සව අත්තිකාරම් | 46,800 |
| විශේෂ අත්තිකාරම් | 9,300 |
| යතුරු පැදි ණය | 285,322 |
| විශේෂ සේවක ණය | 4,800 |
| වැටුප් අත්තිකාරම් | 50,261 |
| එකතුව | 1,315,578 |

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන් ගෙන් අයවියයුත රු.51,543 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුනි.

1:2:5 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

ගෙවීම් ලැබූ බවට සාක්ෂි නොවීම නිසා රක්ෂිතයින් 09 දෙනෙකුට ගෙවූ රු.432,950 ක් වටිනා වන්දි ගෙවීම් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:2:6 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම.**

විගණනයේදී පහත සඳහන් අනුකුල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකුල නොවීම් |
|---|---|
| (අ) 2007 අංක 14 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනතේ 26 (අ)(1) වගන්තිය මගින් සංශෝධිත 2002 අංක14 දරන එකතු කළ අගය මත බදු පනත | එකතුකළ අගය මත බදු වලින් 1/3 ක් වූ රඳවා ගැනීමේ බදු රු.452,928 ක්කුලී ගෙවීම් වලින් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. |
| (ආ) 2006 ඔක්තෝබර් 5 දිනැති අංක 6 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2006 ජනවාර් 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛය | පිරිවැය රු.100,000 කට වැඩි වටිනාකම් ඇති වාහන අළුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් , රු.135,000 ක් පිරිවැය වූ වාහන අළුත්වැඩියාවක් සඳහා එකී අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 104(2) | වාහන 06 කට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මු.රෙ. 110 | අලාභහානි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 371 (2) ආ | 1999 සිට 2010 දක්වාවූ කාලපරිච්ඡේදය තුලදී ගෙවන ලද රු.530,798 ක් වූ විවිධ අත්තිකාරම් හා ඉන්ධන අත්තිකාරම් 2011 මාර්තු 31 දින දක්වා ද නිරවුල් කර නොතිබුණි. |
| (iv) | මු.රෙ.1645 | නියමිත පරිදි වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |
| (v) | මු.රෙ.1646 | වාහන 36 ක් සඳහා වූ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) | මු..රෙ.1647 (අ) | වාහන පිළිබඳ වාර්ෂික සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2006 පෙබරවාරි 14 දිනැති අංක 2/1/එෆ/25 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරීන්ට ගෙවන ලද රු.233,900 ක් වූ අත්තිකාරම් දින 14 ක් තුලදී නිරවුල් කර නොතිබුණි. |

1:2:7 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වංචනික ලෙස වෙනස් කරන ලද ලියවිලි මත බඩ ඉරිඟු රක්ෂණ 36 කට අදාලව එකතුව රු.262,900 ක් වූ වන්දි ගෙවීම් කර තිබුණි.

(ආ) අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් මත වී වගා රක්ෂණයට අදාලව එකතුව රු.318,040 ක් වූ වන්දි ගෙවීම් කර තිබුණි.

(ඇ) වී වගා රක්ෂණයට අදාලව එකතුව රු.135,753 ක් වූ වන්දි ගෙවීම් සිදු කර තිබුණි. කෙසේ වුවද වගාකළ දිනයන් රක්ෂණ දිනට පසු දිනයන් විය.

(ඇ) අනුමත දිනයට පසුව වගාකළ වී වගා රක්ෂණ වලට අදාලව එකතුව රු.77,575 ක් වූ වන්දි ගෙවීම් කර තිබුණි

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය සමාලෝචනය

#### 2:1:1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පරිපාලන වියදම් වෙනුවෙන් රජයෙන් ලැබුණු ප්‍රදානය ගණන් ගැනීමට පෙර මණ්ඩලයේ මෙහෙයුම් ඌනතාවය රු.149,328,371 ක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.73,276,670 ක් විය. රු.86,589,528 ක් වූ පරිපාලන සහ මූල්‍ය වියදම් පියවා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබී ඇති රු.86,141,294 ක රජයේ ප්‍රදාන හා වෙනත් ආදායම් ගණන් ගැනීමෙන් පසු සමස්ථ ඌනතාවය රු.149,776,605 ක් වී තිබුණු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමස්ථ අතිරික්තය වූ රු.67,747,480 සමග සැසදු විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.217,524,085 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

#### 2:1:2 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වී වගා, පශු හා අතිරේක භෝග වගා රක්ෂණ යෝජනා ක්‍රම වෙනුවෙන් විශාල වියදමක් දරා තිබූ බවත් එය මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලයට අහිතකර ලෙස බලපා ඇති බවත් නිරීක්ෂණය විය.

| රක්ෂණ යෝජනා ක්‍රමය | ආදායම | මුළු මෙහෙයුම් වියදම් | මෙහෙයුම් වියදම ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | % |
| (i) වී වගා | 53,009,967 | 179,229,396 | 338.0 |
| (ii) පශු | 11,467,977 | 11,435,121 | 99.7 |
| (iii) සුවසෙත | 9,724,658 | 1,418,054 | 14.6 |
| (iv) අතිරේක භෝග | 26,521,732 | 81,236,620 | 306.3 |
| (v) කෘෂි උපකරණ | 1,182,106 | 48,205 | 4.1 |

(ආ) 2011 වර්ෂය ආරම්භයේදී සිදුවූ ව්‍යසනකාරී අවස්ථාව වෙනුවෙන් වන්දි ගෙවීම පිණිස 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.මිලියන 259 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි.කෙසේ වුවද මණ්ඩලයේ පවතින අරමුදල් රු.මිලියන 243 කට පමණක් සීමාවී තිබුණි.මෙම ඍණාත්මක තතත්වය අනාගත ව්‍යසනකාරී අවස්ථාවන් වෙනුවෙන් වන බැරකම් ගෙවීම් සඳහා බාධකයක් විය හැකිය.

## 2:1:3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ඉකුත් වර්ෂ 5 ක මූල්‍ය ප්‍රතිඵල වලට අනුව රජයෙන් ලැබුණු ප්‍රදාන ගණන් ගැනීමට පෙර ශුද්ධ අතිරික්තය 2009 වර්ෂය හැරුණු විට ක්‍රමානුකූලව පහත බැස තිබූ අතර 2010 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ඌනතාවය රු.මිලියන 150 ක් වී තිබුණි.විස්තර පහත පරිදි වේ.

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මුළු ආදායම | 126 | 114 | 96 | 48 | 43 |
| මුළු වියදම | 361 | 121 | 134 | 50 | 37 |
| ශුද්ධ අතිරික්තය/ඌනතාවය | (235) | (7) | (38) | (2) | 6 |
| රජයේ ප්‍රදාන | 85 | 75 | 42 | 12 | 12 |
| රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | (150) | 68 | 4 | 10 | 18 |

මෙයින් පැහැදිලි වන්නේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු රජයෙන් ලැබෙන ප්‍රදාන මත රඳා පවතින බවයි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 සදහා ආදායම, වන්දිගෙවීම් සහ ඒ සදහා දරන ලද වියදම් පිළිබඳ සැසදුම් ප්‍රකාශයක් පහත දැක්වෙන අතර එයින් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබද අවිනිශ්චිත තාවයක් නිරූපනය වේ.

| වර්ෂය | ලැබුණු වාර මුදල | හිමිකම් ගෙවීම් | මෙහෙයුම් වියදම් | පරිපාලන වියදම් | මුළු වියදම | ලැබුණු වාරමුදල් ඉක්මවූ වියදම |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2006 | 34.3 | 8.9 | 3.0 | 24.9 | 36.8 | (2.5) |
| 2007 | 37.5 | 21.3 | 1.5 | 27.5 | 50.3 | (12.8) |
| 2008 | 70.5 | 27.0 | 4.2 | 78.7 | 109.9 | (39.4) |
| 2009 | 83.4 | 31.0 | 5.7 | 84.1 | 120.8 | (37.4) |
| 2010 | 105.1 | 268.7 | 5.6 | 86.3 | 360.6 | (255.5) |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 රක්ෂණ යෝජනාක්‍රම පරිපාලනය

ලබාගතහැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ රක්ෂණ යෝජනා ක්‍රම වල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විෂයය | මිනුම | ඉලක්කය | | | | ලඟාකර ගැනීම | | | | ලඟාකර ගැනීමේ ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | |
| | | 2009 | 2010 | 2009 රු.(000) | 2010 රු.(000) | 2009 | 2010 | 2009 රු.(000) | 2010 රු.(000) | 2009 % | 2010 % | 2009 රු.(000) | 2010 රු.(000) |
| 1. භෝග රක්ෂණය | | | | | | | | | | | | | |
| (අ) වී වගා | අක්කර | 65,000 | 60,000 | 49,800 | 48,000 | 46,236 | 65,572 | 33,058 | 53,010 | 71.13 | 109.29 | 66.38 | 110.44 |
| (ආ) මිරිස් | අක්කර | 500 | 500 | 700 | 700 | 742 | 194 | 693 | 364 | 148.40 | 38.80 | 99.00 | 52.00 |
| (ඇ) ලොකු ලූණු | අක්කර | 600 | 600 | 1,920 | 1,920 | 479 | 1,021 | 1,626 | 2,719 | 79.83 | 170.17 | 84.69 | 141.61 |
| (ඈ) පොල් | අක්කර | 1,500 | 975 | 1,620 | 1,053 | 6 | 10 | 20 | 11 | 0.40 | 1.03 | 1.23 | 1.04 |
| (ඉ) උක් | අක්කර | 500 | 1,300 | 400 | 3,055 | 29 | 63 | 25 | 377 | 5.80 | 4.85 | 6.25 | 12.34 |
| (ඊ) බඩ ඉරිඟු | අක්කර | 15,000 | 15,500 | 11,250 | 17,050 | 9,542 | 11,101 | 17,089 | 17,977 | 63.61 | 71.62 | 151.90 | 105.44 |
| (උ) අපනයන හා බහු වාර්ෂික බෝග | අක්කර | 1,000 | 600 | 2,800 | 1,680 | 159 | 107 | 384 | 239 | 15.90 | 17.83 | 13.71 | 14.23 |
| (ඌ) මල්පැල | පැල | 280,000 | | 1,120 | 400 | 1,000 | | 2 | 6 | 0.36 | | 0.18 | 1.50 |
| (එ) වැවිලි බෝග | අක්කර | 1,000 | 416 | 2,000 | 832 | 2 | 16 | 5 | 42 | 0.20 | 3.85 | 0.25 | 5.05 |
| (ඒ) අර්තාපල් | අක්කර | 200 | 200 | 1,000 | 1,000 | 416 | 518 | 1,873 | 2,095 | 208.00 | 259.00 | 187.30 | 209.5 |
| (ඔ) වෙනත් බෝග | අක්කර | 1,700 | 900 | 1,300 | 450 | 461 | 2,756 | 360 | 1,985 | 27.12 | 306.22 | 27.69 | 441.11 |
| (ඕ) එළවළු | අක්කර | - | 300 | - | 900 | 147 | 521 | 294 | 807 | - | 173.67 | - | 89.67 |
| 2. පශු | | | | | | | | | | | | | |
| ගව | සංඛ්‍යාව | 11,000 | 11,000 | 26,950 | 27,500 | 4,708 | 5,631 | 12,134 | 11,334 | 42.80 | 51.19 | 45.02 | 41.21 |
| එළු | සංඛ්‍යාව | 8,000 | 8,000 | 2,640 | 2,500 | 3,895 | 3,219 | 1,509 | 1,436 | 48.69 | 40.24 | 57.16 | 57.44 |
| 3. ගබඩා | සංඛ්‍යාව | 150 | 1,000 | 1,313 | 5,000 | 96 | 10 | 508 | 178 | 64.00 | 1.00 | 38.69 | 3.56 |
| 4. කෘෂි උපකරණ | සංඛ්‍යාව | 2,000 | 2,000 | 6,000 | 7,000 | 165 | 454 | 1,036 | 3,225 | 8.25 | 22.70 | 17.26 | 46.07 |
| 5. සුවසෙත | සංඛ්‍යාව | 50,000 | 40,000 | 17.500 | 16,000 | 23,325 | 20,618 | 9,012 | 8,456 | 46.65 | 51.54 | 51.50 | 52.85 |
| 6. ජීවිත රක්ෂණ | සංඛ්‍යාව | 15,000 | 15,000 | 45,000 | 45,000 | 6 | - | 7 | - | 0.04 | 0 | 0.02 | 0 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිරිස්, පොල්, උක්, අපනයන හා බහු වාර්ෂික බෝග, වැවිලි බෝග, ගව, ගබඩා සහ කෘෂි උපකරණ රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් වූ භෞතික ඉලක්කයන්ගෙන් 50% ක් හෝ ළඟාකරගෙන නොතිබුණි. පොල්, උක් , වැවිලි බෝග හා ගබඩා රක්ෂණ සම්බන්ධයෙන් වූ භෞතික ඉලක්ක වලින් ලඟා කර ගෙන තිබුනේ 5% කට වඩා අඩු ප්‍රතිශතයක් පමණක් විය.

(ආ) පොල්, උක්, අපනයන හා බහු වාර්ෂික බෝග, මල්, වැවිලි බෝග, ගව, ගබඩා සහ කෘෂි උපකරණ රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් වූ මූල්‍ය ඉලක්කයන්ගෙන් 50% ක ප්‍රතිශතයක් හෝ ලඟාකර ගෙන නොතිබුණ. පොල්, මල්, වැවිලි බෝග සහ ගබඩා රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් වූ මූල්‍ය ඉලක්ක වලින් ලඟාකරගෙන තිබුනේ 10% කට වඩා අඩු ප්‍රතිශතයක් පමණක් විය.

(ඇ) මිරිස්, එළු සහ ගබඩා රක්ෂණ සම්බන්ධයෙන් වූ භෞතික ඉලක්ක සපුරා ගැනීම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් 109.6%, 8.5%, හා 63% කින් පහත වැටී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ජීවිත රක්ෂණ සම්බන්ධයෙන් වූ භෞතික සහ මූල්‍ය ඉලක්කයන් ලෙස 15,000 ක සංඛ්‍යාවක් සහ රු.මිලියන 45 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එක් පුද්ගලයකු හෝ රක්ෂණය කර නොතිබුණි.

### 2:2:2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

ලබාගතහැකි වූ තොරතරු අනුව සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 2 ක අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | | | තථ්‍ය කාර්ය මණ්ඩලය | | | පුරප්පාඩු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 31.12.2008 | 31.12.2009 | 31.12.2010 | 31.12.2008 | 31.12.2009 | 31.12.2010 | 31.12.2008 | 31.12.2009 | 31.12.2010 |
| විධායක | 107 | 45 | 45 | 81 | 41 | 39 | 26 | 04 | 06 |
| විධායක නොවන | 200 | 263 | 264 | 157 | 193 | 176 | 43 | 70 | 88 |
| සුළු සේවක | 71 | 70 | 69 | 57 | 53 | 60 | 14 | 17 | 09 |
| අනියම් | - | - | - | 95 | 144 | 68 | - | - | - |
| එකතුව | 378 | 378 | 378 | 390 | 431 | 343 | 83 | 91 | 103 |

2008, 2009 හා 2010 වර්ෂ වලදී පිළිවෙලින් 83 ක්, 91ක් හා 103 ක් වූ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 2:2:3 <u>වත්කම් කළමනාකරණය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගතහැකිවූ තොරතුරු අනුව වාහන 07 ක් දිගු කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ තබා තිබුණි.

(ආ) රු.382,111 ක් වූ පාවිච්චි නොකළ මුද්‍රණ ද්‍රව්‍ය තොගයක් සහ රු.451,509 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද උපකරණ තොගයක් 1982 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 2:2:4 <u>සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික කයාකාර් සැලැස්ම</u>

මණ්ඩලය විසින් 2009 - 2012 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුනද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2003 ජූනි 02 දින නිකුත් කරන ලද අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයෙහි 5.1.3 ජේදය ප්‍රකාරව යාවත්කාලීන කර නොතිබුණි. 2010 වර්ෂය සඳහා වූ ක්‍රියාකාර් සැලැස්මේ අරමුණු කර තිබූ ඇතැම් ඉලක්ක සපුරාගෙන නොතිබූ බවත් එය මණ්ඩලයේ යහපාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බවත් නිර්ක්ෂණය විය.

## 2:2:5 <u>අභ්‍යන්තර විගණනය</u>

අභ්‍යන්තර විගණනය ස්ථාපනය කිරීම හා එහි ක්‍රියාකාර්ත්වය පිළිබදව පහත නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන ප්‍රමිති සහ ආචාර ධර්ම සංග්‍රහය

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2009 ඔක්තෝබර් 07 දිනැති අංක ඩීඑම්ඒ/2009(3) දරන චක්‍රලේඛය අනුව මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සහ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහන සැලසුම් කර නොතිබුණි. විගණන වැඩ සටහන පිළියෙල කිරීමේදී පහත දැක්වෙන අභ්‍යන්තර විගණන ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

- (i) පර්ශිෂ්ඨය 2 - කාර්‍ය සාධන ප්‍රමිත - අංක 2110 - අවදානම් කළමනාකරණය
- (ii) පර්ශිෂ්ඨය 2 - කාර්‍ය සාධන ප්‍රමිත - අංක 2201 - සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු

(ආ) 2010 වර්ෂය සඳහා වූ වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩ සටහනේ උපලේඛනගත කර තිබූ පහත දැක්වෙන ක්ෂේත්‍රයන් සහ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

- (i) වත්කම්
- (ii) වගකීම්
- (iii) මානව සම්පත් කළමනාකරණය
- (iv) මණ්ඩලයේ වාහන
- (v) රක්ෂණ කොමිස්
- (vi) මණ්ඩලයේ සමස්ථ කාර්‍ය සාධනය

## 2:2:6 <u>අයවැය ලේඛනමය පාලනය</u>

2010 වර්ෂය සඳහා වූ අයවැය ගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකියයුතු විචලනයන් නිර්ක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව දැක්වුණි.

## 3. පද්ධති සහ පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ අවධානය සඳහා යොමු කරන ලදී .පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

(අ) රක්ෂණ යෝජනා ක්‍රම
(ආ) වන්දි ගෙවීම්
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම
(ඉ) අයවැය ලේඛනය
(ඊ) සේවක ණය සහ අත්තිකාරම් නිරවුල් කිරීම
(උ) නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලවීම